# පිපුණු මලේ රුව

**ශාකයේ පොදු නාමය -:** යොලෝ සරකා.

**ශාක කුළය -:** ෆැබේසියේ (Fabaceae).

**උද්භිද විද්‍යාත්මක නාමය -:** සරකා තයිපින්ජින්සිස් *(Saraca thaipingensis)*



**බහුලව ව්‍යාප්ත වී ඇති රටවල් -:**
මියැන්මාරය, තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව.

**සුදුසු දේශගුණය -:** නිවර්තන දේශගුණය

**ශාකයේ ස්වභාවය -:**
මීටර 7 කට වඩා වැඩි උසකට වැඩෙන සාමාන්‍ය ගසකි.

**සාමාන්‍ය තොරතුරු -:**
හිරු එළිය ප්‍රිය කරන වියළි කාලගුණික තත්ත්ව වලට ඔරොත්තු දෙන ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන ශාකයකි. හොඳින් ජලය බැස යන මද ආම්ලික ගතියක් සහිත පසට රුචි බවක් දක්වයි. මෙම ශාකය අතු කැබලි හෝ බීජ මඟින් ව්‍යාප්ත කර ගත හැකිය. ලපටි පත්‍ර ක්‍රීම් පැහැති වන අතර පහළට එල්ලෙමින් පවතින පොකුරක් ලෙස පවතී. තද කොළ පැහැති විශාල සංයුක්ත පත්‍ර සම්මුඛව හට ගනී. තද කහ පැහැති මල් රාශියක් පොකුරු වශයෙන් කඳෙහි හෝ ප්‍රධාන අතු වල පුෂ්ප මංජරියක හට ගනී. මල් හට ගැනීම උණුසුම් කාලගුණික තත්ත්ව යටතේදී සිදු වේ. විශේෂයෙන් රාත්‍රි කාලයේදී මල් සුවඳවත් වේ. මල් පරවී ගෙන යන විට රතු පැහැයට හැරේ. තුනී පැතලි විශාල දිගු ඵලය පරිණත වන විට දම් පැහැයට හැරී සර්පිලාකාර කොටස් දෙකකට පැලෙයි. එය කලු පැහැති බීජ වලින් සමන්විත වේ.

පිපුණු මලේ රුව මෙවරත් ඔබ වෙත ගෙන එන්නේ -: ආචාර්ය ඒ.එම්.ඒ.එස්. අත්තනායක (නියෝජ්‍ය අධ්‍යක්ෂිකා), සුභාෂිණි සෙනෙවිරත්න (වැඩසටහන් සහකාර) රාජකීය උද්භිද උද්‍යානය පේරාදෙණිය.)



